# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

# ඇබෑර්තු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) තනතුර - (HM 1-1) - තනතුරු 01

**රැකියා විස්තරය :**

ඕනෑම අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ අධිකාරියක් ඉදිරියේ අධිකාරිය නියෝජනය කිරීම, අධිකාරිය වෙනුවෙන් නඩු පිළිබඳ දැන්වීම් භාරගැනීම, අවශ්‍ය විටදී අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම සහ නියෝජනය කිරීම, පනතින් නියම කර ඇති පරිදි අධිකාරියේ අනුකූල වීමේ හා බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ නිකුත් කරන නියෝග ක්‍රියාත්මක කිරීමට නිෂ්පාදකයන් හා වෙළඳුන් අපොහොසත් වන විට ඒ පිළිබඳව විභාග කර පනතින් නියම කර ඇති පරිදි නීතිමය පියවර ගැනීම, අවශ්‍ය විටදී නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් නීති උපදේශකයින් හා අදාළ ආයතන සමග සහයෝගී තාවයෙන් කටයුතු කිරීම, පනතේ සඳහන් පරිදි, අධිකාරිය විසින් ඕනෑම නිෂ්පාදකයෙකු, වෙළෙන්දකු, නිෂ්පාදකයන්ගේ හෝ වෙළඳ සංගමයක් සමග ඇතුළත් වන ගිවිසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම, අධිකාරිය විසින් නිකුත් කරන ලද සියලුම නියෝගයන් හා අධිකාරිය විසින් පවරන ලද අනෙකුත් නඩු කටයුතු පිළිබඳව වාර්තා පවත්වාගෙන යාම, පාරිභෝගික පැමිණිලි ඒකකයේ කටයුතු අධීක්ෂණය කිරීම, අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ගැසට් නිවේදන සකස් කිරීම, අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලවලින් හසුරුවනු ලබන නීති කටයුතු අධීක්ෂණය කිරීම, පනතේ කටයුතු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට පැහැදිලි කිරීම හා උපදෙස් ලබාදීම සඳහා පනතේ සඳහන් මාර්ගෝපදේශ නියෝග හා / හෝ රෙගුලාසි පිළිබඳ පැහැදිලි කර දීම සහ අර්ථනිරූපනය, අධිකාරියේ සියලුම අංශවලට ආධාරක සේවා සැපයීම, පාරිභෝගික කටයුතු සභාවට ආධාරක සේවා සැපයීම, පාරිභෝගික ආරක්ෂාව හා තරගකාරී පරිචයන්ට පටහැනි දෑ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ජාත්‍යන්තර තලයේ සිදුව ඇති නීතිමය සංවර්ධනයන් සම්බන්ධයෙන් හොඳින් දැනුවත් වීම, පහත සඳහන් දෑ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් සහ අධිකාරියේ සාමාජිකයන්ට උපකාරක සේවා සැපයීම.

i. නඩු පැවරීම අවශ්‍ය වන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම්
ii. අර්ථ නිරූපණය කිරීම
iii. නියාමකයෙකු ලෙස ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් අදහස් පැහැදිලිව ලබා දීම
iv. කාර්යය මණ්ඩලය, කම්කරු, සුබසාධන වන්දි හා විනය කටයුතු සම්බන්ධවූ ඕනෑම පවතින දෑ සහ
v. අධිකාරියේ කටයුතු හෝ බැඳියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ ඍජු දයකත්වයක් ඇති ඕනෑම ප්‍රශ්න සහගත කරුණක්

**සුදුසුකම් :**

| | | |
|---|---|---|
| **බාහිර** | : | නීතිඥවරයෙකු වීම සහ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters) සමග නීතිඥයෙක් ලෙස දිවුරුම් දීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමණාකරණ මට්ටමේ වසර 15 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද |
| **අභ්‍යන්තර** | : | තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සේවා කාණ්ඩයේ (MM 1-1) 1 වන ශ්‍රේණියේ යෝග්‍යතා තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාව |
| **වැටුප් පරිමාණය** | : | (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 02 / 2016 චක්‍රලේඛය ප්‍රකාරව)<br>HM 1-1 2016 : රු. (81,670 - 15 x 2,270 - 115,720) |
| **වයස** | : | අවු. 35 ට නොඅඩු සහ අවු. 55 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන්ට අදාළ නොවේ. |
| **ප්‍රවාහන හා ඉන්ධන දීමනාව** | : | නිල වාහනයක් භාවිතා කිරීමට හිමිකම හෝ රු. 50,000.00 ක මාසික ප්‍රවාහන දීමනාව සහ අදාළ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල නියමයන් පරිදි ලීටර් 115 ක ඉන්ධන දීමනාව. |
| **වෘත්තීය දීමනාව** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 දරන චක්‍රලේඛයේ නියමයන් පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ. |
| **අනෙකුත් දීමනා** | : | වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව සහ අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාර වූ අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. |
| **පත්වීමේ ස්වභාවය** | : | ස්ථිරයි. අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත. රජයේ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් හිමිකම් ඇත. |
| **බඳවා ගැනීමේදී වැටුප** | : | බාහිරව බඳවාගනු ලබන පුද්ගලයන් වැටුප් පරිමාණයේ මූලික පියවරේ පිහිටුවනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගනු ලබන පුද්ගලයන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව තීරණය කරනු ලැබේ. |
| **සේවයේ ස්ථිර කිරීම** | : | පත්කරනු ලබන අපේක්ෂකයන් වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාසය කාලය තුළදී ඔහු / ඇයගේ කාර්ය සාධනය හා හැසිරීම සතුටුදායක වේ නම්, ඔහු / ඇය තනතුරේ ස්ථිර කරනු ලැබේ. අභ්‍යන්තරව තෝරාගනු ලබන අපේක්ෂකයන්, යම් තනතුරක දැනටමත් ස්ථිර නම්, වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | : | අධිකාරිය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මඬුල්ලක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි. |
| **සම්මුඛ පරීක්ෂණය** | : | සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය පහත සඳහන් වේ. |

| | | |
|---|---|---|
| • අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| • අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| • අනෙකුත් සාධනයන් | - | ලකුණු 15 |
| • සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය | - | ලකුණු 25 |
| **මුළු ලකුණු** | | **ලකුණු 100** |

**පොදු කොන්දේසි :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් නිසිලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.
- අනර්ඝ හා ශිෂ්ඨ චරිතයක් තිබිය යුතුය.

යෝග්‍යතා පූර්ණ අපේක්ෂකයින් 2023.06.07 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ස්වකීය අයදුම්පත් ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ සේවා ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අවසාන දිනයට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනිසි බලපෑම් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**2 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**